## සංශෝධනයයි

### අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**2022 අංක 18 දරන පනතින් සංශෝධිත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සහ 2023 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත ප්‍රකාරව දැනුම්දීම**

2022 අංක 18 දරන පනතින් සංශෝධිත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 442 වගන්තිය මගින් අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අපරාධ අධිකරණයක, නඩු තීන්දුවක හෝ අවසාන ආඥාවක හෝ යම් දිවුරුම් සාක්ෂියක හෝ නඩු වාර්තාවේ වෙනත් කොටසක පිටපතක් ඉල්ලුම් කරන විට, යම් විශේෂ හේතුවක් නිසා එය ගාස්තු අයකිරීමෙන් තොරව ලබා දීම සුදුසු යයි අධිකරණය විසින් සලකනු නොලබන අවස්ථාවන්හි දී, එම පිටපත් නිකුත් කිරීම වෙනුවෙන් අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 13/97 හා 6/2006 අනුව දැනට අයකරනු ලබන ගාස්තු පහත උපලේඛනය පරිදි සංශෝධනය කරනු ලැබේ.

### උපලේඛනය

| අනු අංකය | කාරණය | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| 1. | සහතික කරන ලද ඡායා පිටපත් ගාස්තුව | කොළයක් - රු. 30.00<br>පිටුවක් - රු. 20.00 |
| 2. | ඉදිරිපත් කරනු ලබන පිටපත් සඳහා සහතික කිරීමේ ගාස්තුව | කොළයක් - රු. 15.00 |
| 3. | පිටපත් යතුරු ලියනය කිරීමේ සහ සහතික කිරීමේ ගාස්තු | පේළි 25ට වැඩි පිටුවක් සඳහා - රු. 60.00<br>පේළි 15 සිට 25 දක්වා - රු. 40.00<br>පේළි 15 ට අඩු පිටුවක් සඳහා - රු. 30.00 |
| 4. | පරිගණකයක/ දත්ත ගබඩා කිරීමේ උපාංගයක ගබඩා කර ඇති යතුරු ලියනය කරන ලද ලේඛනයක මුද්‍රිත පිටපතක් නිකුත් කිරීමේ ගාස්තු | පේළි 25ට වැඩි පිටුවක් සඳහා - රු. 40.00<br>පේළි 15 සිට 25 දක්වා පිටුවක් සඳහා - රු. 30.00<br>පේළි 15 ට අඩු පිටුවක් සඳහා - රු. 20.00 |

CamScanner

| අනු අංකය | කාරණය | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| 5. | නඩු වාර්තාවල ඩිජිටල් පිටපත් නිකුත් කිරීමේ ගාස්තු | සංයුක්ත තැටි (CD) 01ක් සඳහා අය කිරීම - රු. 150.00<br>පරිලෝකනය කිරීම සහ පිටපත් කිරීමට එක් පිටුවක් සඳහා අය කිරීම - රු. 5.00<br>කොළයක් - රු. 10.00 |
| 6. | නඩු විභාගවල ශ්‍රව්‍ය පටිගත කිරීම් නිකුත් කිරීමේ ගාස්තු | USB Drive (16 GB) 01ක් සඳහා අය කිරීම - රු. 1,750.00 ශ්‍රව්‍ය පටිගත කිරීම් සෑම මිනිත්තු 30ක් සඳහා අය කිරීම - රු. 500.00 |
| 7. | නඩු විභාගවල ශ්‍රව්‍ය දෘශ්‍ය (විඩියෝ) පටිගත කිරීම් නිකුත් කිරීමේ ගාස්තු | USB Drive (16 GB) 01ක් සඳහා අය කිරීම - රු. 1,500.00<br>ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් සෑම මිනිත්තු 30ක් සඳහා අය කිරීම - රු. 750.00 |
| 8. | නඩු ගොනුවක ගොනු කර ඇති පිඹුරක ඡායා පිටපත් ලබාගෙන සහතික කර නිකුත් කිරීමේ ගාස්තු | • A4 පිටුපත් සඳහා - රු. 20.00<br>කොළයක් සඳහා - රු. 30.00<br>• Legal පිටුපත් සඳහා - රු. 30.00<br>කොළයක් සඳහා - රු. 40.00<br>• A3 පිටුපත් සඳහා - රු. 40.00<br>කොළයක් සඳහා - රු. 60.00 |
| 9. | මැනුම් සභාවේ සහතික ලත් අධිකරණයේ ලියාපදිංචි සැලසුම් ශිල්පියෙකු මගින් ප්‍රතිනිර්මාණය කළ පිඹුරක සහතික කළ පිටපතක් නිකුත් කිරීම. | A4 - රු. 1,000.00<br>Legal - රු. 1,200.00<br>A3 - රු. 2,000.00<br><br>ඊට අමතරව පිඹුරට අදාළ ඉඩම කැබලි 10 වඩා වැඩිවන අවස්ථාවක දී එසේ කැබලි 10 වඩා වැඩිවන සෑම අතිරේක කැබැල්ලක් සඳහා ම රු. 100.00ක ගාස්තුවක් අය කළ යුතු ය.<br><br>ඊට අමතරව අදාළ ඉඩමේ පරිමාණය අක්කරයක් දක්වා අතිරේක ගාස්තුවක් අය නොකළ යුතු අතර අක්කරයට වඩා වැඩිවන සෑම අක්කරයක් හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු ය.<br><br>ඊට අමතරව ඉඩමේ පිහිටා ඇති ගස්, ගොඩනැගිලි හා වැව්, පොකුණු ආදී ස්වභාවික පිහිටීම් වැනි දෑ සලකා පිඹුරේ සංකීර්ණත්වය අනුව අතිරේකව රු. 500.00ක උපරිමයකට යටත්ව ගාස්තු අයකරනු ලැබේ.<br><br>ඊට අමතරව පිඹුරේ කැබලි විස්තරය, දිශාගත මායිම් සහ අනෙකුත් විස්තර ඇතුළත් කිරීම වෙනුවෙන් රු. 200.00ක අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ. |
| 10. | බලයලත් මිනින්දෝරුවරයකු විසින් සකස් කරන ලද පිඹුරු පිටපතක් සහතික කොට නිකුත් කිරීම. | රු. 1,000.00 |
| 11. | සහතික කළ පිටපත් විද්‍යුත් තැපැල මගින් නිකුත් කිරීමේ දී, පරිගණකයක හෝ දත්ත ගබඩා කිරීමේ උපාංගයක ගබඩා කර නොමැති, සහතික පිටපත් නිකුත් කිරීම සඳහාම යතුරුලියනය කර සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු | පේළි 25ට වැඩි පිටුවක් සඳහා - රු. 60.00<br>පේළි 15 සිට 25 දක්වා පිටුවක් සඳහා - රු. 40.00<br>පේළි 15 ට අඩු පිටුවක් සඳහා - රු. 30.00 |
| 12. | සහතික කළ පිටපත් විද්‍යුත් තැපැල මගින් නිකුත් කිරීමේ දී පරිගණකයක හෝ දත්ත ගබඩා කිරීමේ උපාංගයක ගබඩා කර ඇති සටහන් සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු. | පේළි 25ට වැඩි පිටුවක් සඳහා - රු. 40.00<br>පේළි 15 සිට 25 දක්වා පිටුවක් සඳහා - රු. 30.00<br>පේළි 15 ට අඩු පිටුවක් සඳහා - රු. 20.00 |
| 13. | සහතික කළ පිටපත් විද්‍යුත් තැපැල මගින් නිකුත් කිරීමේ දී නඩු වාර්තාවේ ගොනු කර ඇති වෙනත් ලේඛනයක් පරිලෝකනය කර සහතික කර නිකුත් කිරීමේ ගාස්තු | පිටුවක් - රු. 20.00 |
| 14. | විද්‍යුත් තැපැල මගින් සහතික කළ පිටපත් නිකුත් කිරීම සඳහා ඉල්ලා සිටින සහතික පිටපතෙහි ස්වරූපය හෝ ප්‍රමාණය නොසලකා රු. 100.00 ගාස්තුවක් අය කරනු ලැබේ. | |

CamScanner